# උපෝසථ දිනය හා උපෝසථ වත පිළිබඳ විමසුමක්

- කිරිමැටියාවේ ධම්මසිරි හිමි

## 1. හැඳින්වීම

භාරතීය සමාජ ඉතිහාසය පරීක්ෂා කරන විට පෙනීයන සුවිශේෂී ලක්ෂණයක් නම් මිනිසාගේ උපතේ සිට මරණය දක්වා දිනය වේලාව ඉතා වැදගත් කොට සැලකීමය. විටෙක එය මිනිස් ජීවිතයට පමණක් සීමා නොවී ආගමික සංස්ථාවන්ට පවා බලපෑමක් එල්ල කොට ඇත. ඒ අනුව බ්‍රාහ්මණ සමාජයේ ස්වකීය ආගමික කෘත්‍යයන් සඳහා වෙන් කොට ගත් දිනය උපොසථ/උපවසථ දිනය නම් විය. මෙහි නිරුක්තාර්ථය සංස්කෘත භාෂාවෙහි *upavasatha* උපවසථ යන වචනයෙන් හින්නව *uposatha* උපොසථ යන පාලි වචනය නිර්මාණය වී ඇත. සංස්කෘත වියරණ ග්‍රන්ථවලට අනුව 'උප' යන උපසර්ග පදය පෙරටුව වස් නැමති ධාතුවෙන් නිර්මාණය වූ පරස්මෛ පදයෙහි වර්තමාන කාල ප්‍රථම පුරුෂ ක්‍රියා රූපය 'උපවසති' නම් වේ. එයින් අර්ථවත් වනුයේ සමීපයේ වසයි, ජීවත්වෙයි, යන්නය.[1] උපෝසථ යන්නෙහි ප්‍රාකෘත රූපය 'උවාසද්ධ' නම් වේ. එය හීබ්‍රෑ බසින් 'සබත්' වශයෙක්ද මිශ්‍ර සිංහල බසින් 'උපොෂථ' නමින්ද ශුද්ධ සිංහල බසින් පෙහෙවස, පෝහොය, පෝ වශයෙන් දක්වා ඇත. පාලි සිංහල ශබ්දකෝෂයෙහි එහි වාග් භේදය දක්වා ඇත්තේ පෞෂථෟ> පොසථ> උපොසථ> පෙහෙවස> පොහොය> පෝය ලෙස ය. පණංගල ජිනරතන හිමියන්ගේ භික්ෂු භික්ෂුණී ප්‍රාතිමෝක්ෂ වර්ණනාවෙහි දක්වා ඇති ආකාරයට උපොසථ යන්න නිර්මාණය වී ඇත්තේ



උප+√වස+අථ =උපොසථො ලෙසයි. "උප" යනන සමීපාර්ථය ද "වස" යන්න නිවාසෙ, විසීම යන අර්ථය ඇති භුවාදී ගණික ධාතු මූලයකි. ''මේ අනුව උප + වස + අථ ප්‍රත්‍යය යෙදීමෙන් හෝ 'ථො' ප්‍රත්‍යය යෙදීමෙන් හෝ උපොසථ යන්න සෑදේ. මෙයින් සමීපයට එළඹ වාසය කරත් යන අර්ථය ප්‍රධානත්වයට පැමිණේ. උපොසථ යන්නෙහි උපවාස අර්ථය ද ඇතුලත් වේ. උපවාස අර්ථය ගැනීමේ දී 'අනසනෙ උපවාසොති උපවාසො' උපොසථො' යැයි නිරුක්තිය දැක්විය හැකිය. මෙහි පද සිද්ධිය ද උප + √වස + අථ හෝ ථ හෝ ප්‍රත්‍යාන්ත වීමයි. මෙයින් ආහාර නොගැනීමෙහි එළඹ වාසය කරත් යන්න අර්ථවත් වේ''.[2] මෙලෙස බලන විට පෙනීයන්නේ විවිධ ශබ්දකෝෂ උපොසථය ලෙස පහත යෙදුම්වන උදෙසීම, ශීලයෙහි පිහිටීම, උපවාසයෙහි යෙදීම, ප්‍රඥප්ති අර්ථය, උපොසථ දිනය, සංඥා නාමය, උපොසථ කර්මය හෙවත් පොහොය කර්මය යනුවෙන් විවිධාර්ථ දක්වා ඇති බවයි. එම සියලු යෙදුම් තුළ කිසියම් සම ස්වරූපි බවක් දැකිය හැකිය.

"ඓතරේය" හා "ශතපථ" බ්‍රාහ්මණ ග්‍රන්ථ පරීක්ෂා කරන විට 'උපවසථ' යන්නෙන් අර්ථවත් වනුයේ පොහෝදිනය, සෝම යාගයට පෙර දිනය, සෝම යාගයට සූදානම්වන කාලපරිච්ඡේදය, නොවෙනස්වන ස්ථානය හා ග්‍රාමය යන අර්ථයන්ය. ගුණසේන සිංහල මහා අකාරාදිය "උපවස්" යන්නෙන් උපවාසය හා ගුණයන් රැකීම සඳහා අහාර නොගැනීම අදහස් වන බව දක්වා ඇත.[3] ඩී.ඊ. හෙට්ටිආරච්චි මහතාගේ සිංහල ශබ්ද කෝෂය උපොසථය යන්නෙන් පොහොය දවස, විශේෂයෙන් පොහොය පිරීමට නියමිත චාතුද්දසී හා පණ්ණරසී දිනයන්, පාමොක් දෙසීම, පොහොය දිනය, පොහොය දිනයේ සංඝ කර්ම කිරීම, භික්ෂූන් පොහොය කරන දවස, පෙහෙවස් සමාදන්වන දින, මෙන්ම විශේෂයෙන් තුදුස්වක හා පසළොස්වක් දින අදහස් කොට ඇත. විනය කෝෂය "උපෝසථ" යන්නෙන් සුවිශේෂී අර්ථ රාශියක් පෙළගස්වා ඇත. උපෝසථ යන්නෙන් පොහොය, පොහොය කිරීම, උපෝසථ කර්මය, චාතුද්දසී, පණ්ණරසී, සාමග්ගි, සංඝ,

ගණ, පුද්ගල, සුත්තුද්දේස, අධිට්ඨාන, පාරිශුද්ධි යන නව වැදෑරුම් උපෝසථය හෝ චාතුද්දසී පණ්ණරාසී යනුවෙන් දෙවදෑරුම් වූ හෝ උපෝසථය අදහස්වන වන බව එහි පැවසේ.[4] චිල්ඩර්ගේ *Dictionary of Pali Language* ශබ්දකෝෂය උපොසථ යන්නෙන් අදහස් කර ඇත්තේ බෞද්ධ සබත් දිනය හෝ ආහාර අනුභවයෙන් වියුක්ත දිනය මෙන්ම ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත දින ලෙසයි.[5] මෙම අදහසටම සමාන අදහසක් ඤාණතිලෝක හිමියන්ගේ *Buddhist Dictionary* ශබ්දකෝෂයෙහිද දක්වා ඇත. මඩිතියවෙල සුමංගල හිමියන් උපොසථ යන්නෙන් පාමොක් දෙසිම, ශීලයෙහි පිහිටිම, උපවාසය, පනත, උපොසථ දිනය ඇතුලු සංඥා නාම අදහස් කරන බව සඳහන් කොට ඇත.[6] පෙළ දහම උපොසථ යන්න සඳහා විවිධාර්ථ රාශියක් එකතු කොට ඇත. (පාමොක් උදෙසිම උපොසථං සම්පාදුනිස්සාමාති... උපොසථ දිවසේ ආරොචෙතබ්බා) පවාරණ යනුවෙන් ද පිරිසිදුවීම සඳහා උපොසථය කලයුතු බව දක්වයි. (අත්තනො පාලියා පාරිසුද්ධිං උපොසථො කාතබ්බො...) මීට අමතරව ශීලයෙහි පිහිටීම යන අර්ථයෙන් ද පෙලෙහි උපොසථ යන්න විග්‍රහ කොට ඇත. (එවං අට්ඨංග සමන්නාගතො ඛො විසාඛෙ උපොසථො උපවුත්තො) මිට නිදසුන් ලෙස අංගුත්තර නිකායේ දක්වා ඇත්තේ උපොසථං භන්තේ අජ්ජ උපවසාමිති, ස්වාමිනි අද උපවාසයේ යෙදෙන්නේය. එහිදි සීල සමාදානය වැනි අර්ථයක් ඉස්මතුවේ. මහාවග්ග පාලියෙහි උපොසථක්ඛන්ධකයට අනුව එය පැනවීම් අර්ථයෙන් ද, ප්‍රඥප්තිය, පනත යනාර්ථයෙන් ද භාවිතවේ. තවත් විටෙක එය සංඥානාමාර්ථයෙන්ද භාවිතවේ. උපොසථො නාම නාගරාජා යන අවස්ථාව දැක්විය හැකිය. තවත් විටෙක සිල්වත්ව සමීපයෙහි වාසය කරන්නේය යනාර්ථයෙන් ද භාවිතවේ. (උපවසන්ති සීලෙනවා... උපෙතා හුත්වා වසන්තීති අත්ථො...) ඉහත දැක්වූ සියලු අර්ථ දෙස බැලුවිට පෙනීයන්නේ උපොසථ දිනය බෞද්ධ ආගමික චාරිත්‍ර විධියක් මෙන්ම ආයති සංවරය වර්ධනය කිරීම සඳහා වෙන්වුන හෝ වෙන් කළ දිනය ලෙසින් භාවිත වී ඇති බවයි. මෙහි උපවාස යන වචනය බොහෝවිට ඉංග්‍රිසි භාෂාවෙන් *Fasting* යනුවෙන් දක්වා ඇත.



එය නිරාහාරව සිටිම යනුවෙන් සිංහලට පරිවර්තනය කරනු ලබයි. ඒ අනුව එකී අර්ථයට සමානාර්ථයෙන් බුදුසමයේ 'උපොසථ' යන්න භාවිතා නොවෙතත් යම් තරමකින් ඊට සමානකමක්ද දැකිය හැක. විශේෂයෙන්ම නිරාහාරව සිටීම පමණක් බෞද්ධ උපොසථයෙන් අවධාරණය කොට නොමැති අතර පුද්ගල ආයති සංවර්ධනය වර්ධනය පිණිස ශීලමය ප්‍රතිපදාවක් ඊට දායක කොට ඇත.

## 2. බෞද්ධ උපොසථයෙහි ආරම්භය හා විකාශය

බෞද්ධ උපොසථයේ ආරම්භය මූලික වශයෙන් දක්වනුයේ මහවග්ග පාලියෙහි උපොසථක්ඛන්ධකය තුළිනි. එහි සඳහන් ආකාරයට අන්‍යලබ්ධිකයින් තුදුස්වක්, පසළොස්වක්, අටවක්හි එක් ස්ථානයකට රැස් වී එහි පැමිණෙන අනුගාමිකයන් සඳහා ස්වකීය ලබ්ධියෙන් දේශනා පවත්වත්. මෙකී ලක්ෂණය බෞද්ධ භික්ෂූන් අතර දක්නට නොලැබුණු හෙයින් සාමාන්‍ය ජනතාවට ධර්මය උගෙනීමට අවස්ථාවක් දිය යුතු යැයි සිතූ මගධාධිපති බිම්බිසාර මහරජු ආර්යයන් වහන්සේලාත් තුදුස්වක්, පසළොස්වක්, අටවක්හි රැස් වුවහොත් යහපත් බව බුදුන් වහන්සේට පවසන ලදි. එම ඉල්ලීම මුල්කොට ගනිමින් බුදුන්රජාණන් වහන්සේ භික්ෂූන්ට එමදිනයන්හි රැස්වන ලෙස අනුදැන වදාලසේක. (අනුජානාමි භික්ඛවෙ චාතුද්දසෙ පණ්ණරසෙ අට්ඨමියා ච පක්ඛස්ස සන්නිපතිතුන්ති.) මහණෙනි, තුදුස්වක්හි පසළොස්වක්හි පක්ෂයේ අටවක්හි රැස්වන්නට අනුදනිමි. මෙහිදි භික්ෂූහු එම දිනයන්හි රැස්ව තුණ්හීභූතව නිශ්ශබ්දව හිඳිති. භික්ෂූන්ගේ නිහඬතාවයට විරුද්ධවූ මහජනයා භික්ෂූන්ට දොස්නගනුයේ "ශ්‍රමණ ශාක්‍ය පුත්‍ර භික්ෂූහු ගොළු ඌරන්මෙන් තුදුස්වක්හි පසළොස්වක්හ නිහඬව රැස්ව සිටිති" යනුවෙනි. ජනමතයට ගරුකල බුදුන් වහන්සේ එවන් උපෝසථ දින පොදුජනයා හට දහම් දෙසිම සඳහා යොදාගන්නා ලෙස භික්ෂූන්ට අනුදැන වදාරන ලදී. පසුව එම උපෝසථ දිනය භික්ෂූන්ගේ උපෝසථ කර්ම සිදුකිරීම සඳහා ද යොදාගත යුතු යැයි අනුදැන වදාළහ. (යන්නූනාහං යානි මයා භික්ඛූනං පඤ්ඤත්තානි සික්ඛාපදානි, තානි නෙසං පාතිමොක්ඛුද්දේසං

අනුජානෙයාං, සො නෙසං භවිස්සති උපොසථකම්මන්ති.) ඒ අනුව උපෝසථකර්මය යනු උපෝසථාගාරය තුළ දී බුදුන්වහන්සේ විසින් පැනවූ ශික්ෂා පද යලි සජ්ඣායනා කිරීම ලෙස දැක්විය හැකිය. එහෙත් මෙය හුදු සජ්ඣායනයකට පමණක් සීමා නොවී ඇති අතර ඉන් ඔබ්බට යාහැකි ආධ්‍යාත්මික ප්‍රවේශයක් එහි දක්වා ඇත. ප්‍රාතිමොක්ෂ දේශනාව යනුවෙන් හඳුනාගත යුතුවනුයේ විනය පිටකයෙහි සංග්‍රහකොට ඇති 227 පමණ වූ භික්ෂූන් සඳහා වෙන්වූ ශික්ෂාපද හා භික්ෂූණීන් සඳහා සංග්‍රහ කොට ඇති 311 පමණ ශික්ෂාපද යන සියල්ල පමණී, උපොසථ දිනයන්හි සූත්‍ර හා අභිධර්ම පිටකාගත ඉගැන්වීම් හා සූත්‍ර දෙශනාවන් සජ්ඣායනා කරන බවක් දක්වා නොමැත. ඉන් වඩාත් තහවුරුවනුයේ භික්ෂු පැවැත්ම සඳහා ඉවහල්වන ශික්ෂාපද පිළිබඳව යලි යලිත් සිහිපත් කිරීම තුළින් ආයතනගත පුද්ගල ශික්ෂණය ගොඩනැංවීමය. පාමොක් දෙසිම තුළින් බලාපොරොත්තු වී ඇත්තේ වරදින් භික්ෂුව මුදවා නිවැරදි මාවතකට මෙහෙයවීමය. පාමොක් උදෙසීම පිළිබඳ විග්‍රහ කරනු ලබන I.B. හෝනර් ''පාමොක් උදෙසීමේ අරමුණ වූයේ පාපෝච්චාරණය මඟින් අවුරුද්දේ (වියලි) මාස නවයකදි වැරදි දුරුකිරිම බවයි''[7] එහෙත් මෙය එතරම් අර්ථ සම්පන්න ප්‍රකාශනයක් නොවේ. බුදුරජාණන් වහන්සේ අනුදැන ඇත්තේ පාතිමොක්ඛ යන සීලසංවරයයි, එය කුසල ධර්ම සංවර්ධනයට අත්‍යවශ්‍ය වන්නකි. ඒ අනුව ප්‍රාතිමෝක්ෂය උදෙසීම උපෝසථයේ ප්‍රධාන අංගය බවට පත්විය.[8] පාමොක් උදෙසීම, අවුරුද්දෙ සෑම අඩමසකට වරක් සිදුකළ යුත්තක් ලෙස දක්වා ඇත. විශේෂයෙන්ම පාමොක් උදෙසීම හා උපොසථ කරණය යනු එකම ක්‍රියාවිධියක් සඳහා යෙදුන නම් දෙකකි. මීට නිදසුන් ලෙස මහාවග්ග පාලියෙහි දක්වා ඇත්තේ (මයා භික්ඛූනං පඤ්ඤත්තානි සික්ඛා පදානි තානි නෙසං පාතිමොක්ඛුද්දෙසං අනුජානෙයාං, සො තෙසං භවිස්ස්ති උපොසථ කම්මං) ශාස්තෘන් වහන්සේ විසින් පනවන ලද ශික්ෂා භික්ෂූන් ලවා උදෙසවීම භික්ෂූන්ගේ පාමොක් උදෙසීමද උපොසථය ද වේ යැයි පැහැදිලිව දක්වනු ලබයි. උපොසථයක අවශ්‍යතාව පිළිබඳව කරුණු සෙවිමෙදී මජ්ඣිමනිකායෙහි සඳහන්ව ඇති



06 JUN 2014

භද්දාලිය හා කීටාගිරි සූත්‍ර ද්වය තුළින් පෙන්වා දෙනුයේ සසුනේ පැවැත්ම සඳහා හා සැබෑ භික්ෂු ජීවිතයට අනුග්‍රහයක් ලෙස තථාගතයන් වහන්සේ විසින් ශික්ෂා පද පැනවූ බවයි. ඒ අනුව එකී අරමුණු ප්‍රායෝගිකව අර්ථවත් වූ අවස්ථාවක් ලෙස උපොසථාගාරයට රැස්ව භික්ෂූන් විසින් සිදුකළ උපොසථ වත හැදින්විය හැකිය.

විශේෂයෙන්ම ප්‍රාග් බෞද්ධ භාරතයේ පැවති උපොසථ ක්‍රමය චන්ද්‍රයාගේ ගමන් මඟ අනුව සකස් වුවද බෞද්ධ උපෝසථය ඉන් ඔබ්බට යමින් විනය ප්‍රඥප්ති මාලාවකට අනුගත වෙමින් විමුක්ති මාර්ගය වැඩිම හා සංඝයා අතර අන්‍යෝන්‍ය විශ්වාසය තහවුරු කිරීම සඳහා ඇතිකර ගත් සාසනික සම්ප්‍රදායක් බව වටහා ගත හැකිය. බෞද්ධ උපොසථයේ ප්‍රධාන අරමුණු ලෙස දැක්විය හැක්කේ ආයතනගත පුද්ගල කළමනාකරණය, වැඩිමහල් භික්ෂුවගෙන් නවක භික්ෂූන් අවවාද අනුශාසනා ලබා ගැනීම, එකිනෙකා එකිනෙකාව හඳුනාගැනීම, එකිනෙකා එකිනෙකාව තේරුම් ගැනීම, කළයුත්ත නොකොළ යුත්ත පිළිබඳව දැනුවත්වීම, තම ප්‍රදේශයේ, තම ආරාමයේ හෝ ආවාසයේ වැඩසිටින භික්ෂු පිරිස් හා බැඳුණු විවිධ ගැටලු නිරාකරණය සඳහා අවස්ථාව ලබාගැනීම වැනි අභිමතාර්ථ උපෝසථයෙන් බලාපොරොත්තු වී ඇත. බෞද්ධ උපොසථයේ විනිවිද භාවය පිළිබඳව දක්වන අදහසක් නම්, එය බ්‍රාහ්මණයින්ගේ උපවසථයත්, ජෛනයන්ගේ පෝෂධයත් හා සමාන වනුයේ නාම මාත්‍රයෙන් පමණි. එහි චර්යා විධි හා අරමුණු අතින් බෞද්ධ උපොසථ සංස්ථාව අන් සියල්ලෙන් වෙනස්ය[9] යන්නයි.

## 3. උපොසථ දිනය

පෙහෙවස් සමාදන්වන දිනය උපොසථ කරණයට භික්ෂු පිරිස් සහභාගිවන දිනය උපොසථ දිනය නම් වේ. එහෙත් උපොසථ දින නාම්‍ය කරණය හා ගැනුම් ක්‍රමය සූර්ය මාස ක්‍රමය මත සිදුනොවන අතර එය චන්ද්‍ර මාස ක්‍රමය මත සිදුවේ. ඒ අනුව උපොසථ කරණය සඳහා වර්ෂ, ඍතු, පක්ෂ හා තිථිය ඉතා වැදගත්වේ. විශේෂයෙන් ශුක්ල හා කෘෂ්ණ පක්ෂයන්හි පළමුවන

06 JUN 2014



දෙවන දවස් ගණනය ද ඉතා වැදගත් කොට සලකනු ලබයි. චන්ද්‍ර මාස ක්‍රමය අනුව ඒ ඒ මාසයන්හි නව සඳ දිනය පුරවශයෙන් ගෙන පැළවිය, දියවක, තියවක, ආදි ලෙස පසළොස්වක යැයි ද පසළොස්වක් පොහොයට පසු දින අව වශයෙන් ගෙන අව පැලවිය, අවදියවක ආදි ලෙස අවපක්ෂයෙන් ගණනය කළ යුතුය. මෙලෙස මසකට දෙවරවක් පුරපක්ෂයේ පුර පසළොස්වක දින ද අව පක්ෂයේ අව පසළොස්වක දිනය හෙවත් අමාවක නොඑසේ නම් කළුවර පක්ෂයේ පසළොස් වැනි දිනයෙහි උපොසථය කළ යුතුය.

ඒ අනුව පැළවියෙහි (පුර පසළොස්වක ගෙවීගිය දිනට පසු දින) පටන් 'තිථි' දින තුදුසක් හෙවත් (13) ක් ගෙවීමෙන් පැමිණි පොහොය 'චාතුද්දසී වන අතර අවපක්ෂයෙන් 'තිථි' දින පසළොසක් (15) සම්පූර්ණ වීමෙන් පැමිණි පොහොය පණ්ණරසී නම් වේ. මෙහිදී පක්ෂයක් ලෙස ගැණෙනුයේ අඩමසකි, අඩමසකට වරක් බැගින් චාතුද්දසී උපොසථය හෝ පණ්ණරසී උපොසථය සිදු කළ වුවද අසවල් පක්ෂයේ චාතුද්දසී ද පණ්ණරසී ද යන්න තීරණය කළ යුතුවනුයේ ඒ ඒ පක්ෂයන්ගේ චන්ද්‍රකාලානු ක්‍රමයෙන් තිථීන්ගේ සම්පූර්ණ වීම අනුවය. බුදුසමයට අනුව වර්ෂයකට ඍතු තුනෙකි, මාස දොළොසෙකි, ඍතුවකට මාස සතරෙකි, මාසයකට පක්ෂ දෙකකි. විශේෂයෙන්ම චාතුද්දසී හා පණ්ණරසී යන දින හැර වෙනත් දින උපොසථ කරණය සඳහා යොදානොගත යුතු බව බුද්ධානුසාසනයයි. මින් තහවුරු වනුයේ සමස්ථ භික්ෂු සමාජයම එක අරමුණක් සඳහා එක දිනයක පෙළ ගැසී ක්‍රියා කිරීම භික්ෂු සංස්ථාවේ චිර පැවැත්මට අතිශයින්ම හේතු වන බවයි. එහෙත් කිසියම් කරුණක් නිසාවෙන් භික්ෂූන් අසමගියට පත්ව යලි සමගි වී නම් එම මොහොතේ උපොසථය කළ හැකිය. ඒ සඳහා චාතුද්දසී හා පණ්ණරසී යන දින උදාවන තෙක් බලා නොසිට සාමග්ගි උපොසථය සිදුකළ හැකිය. ඒ අනුව පෙනීයන්නේ උපොසථය සපුරාම සංඝ සමග්‍රිය උදෙසා ප්‍රබල මෙහෙයක් සලසන බවයි.



## 4. උපොසථ වත යනු

උපොසථාගාරයක් තුළ සියලු කෘත්‍යයයන් උපොසථ වත ලෙස ඉතා සරලව හඳුනාගත හැකිය. එය 'පුබ්බ කරණ' හා 'පුබ්බ කිච්ච' ලෙස පෙලෙහි දක්වා ඇත. මෙහි 'පුබ්බ කරණ' යනු පොහොය ගෙයට අවතීර්ණ වීමට පෙර සූදානම් කළයුතු අවශ්‍යතා වන පොහොය ගෙහි කසල හැමදීම, පහන් දැල්වීම, අසුන් පැනවීම, පාණීය හා පරිභෝජනීය ජලය තැබීම ලෙසද පුබ්බ කිච්ච වශයෙන් දක්වා ඇත්තේ භික්ෂූන්ගේ කැමැත්ත හා පිරිසිදු බව විමසීම, ඍතු, පක්ෂ ගණනය, රැස්වූ භික්ෂු පිරිස් ගණනය කිරීම හා භික්ෂුණීන්ට අවවාද දීම වැනි ක්‍රියාකාරකම්ය. විශේෂයෙන්ම යම් භික්ෂුවක් ගිලන් බව නිසා උපොසථයට සහභාගි වීමට නොහැකි නම් එම භික්ෂුවගේ කැමැත්ත උපොසථාගාරයේදී අකෙක් භික්ෂූන්ට සැලකළ යුතුය. පාමොක් උදෙසීමට පෙර අන්තරායික පුද්ගලයන් 21 දෙනෙකු දුරුකළ යුතුබව දක්වයි. ඒ අනුව, පැවිද්ද සොරකම් කළහු, තීර්ථකයන් කරා ගිය අයෙකු, මව මැරූ කෙනා, පියා මැරූ කෙනා, රහතුන් මැරූ කෙනා, මෙහෙණ දූෂණය කල කෙනා, සංඝභේදය කල අයෙකු, ලෝහිතපක්ඛන්දිකා රෝගියෙකු, උභතොබ්‍යඤ්ජනකයා ආදි අන්තරායික පිරිස් දුරුකළ යුතුය. මින් වඩාත් තහවුරු වනුයේ උපොසථය සඳහා වඩා යහපත් කායික හා මානසික ශක්‍යතාවන්ගෙන් යුක්ත භික්ෂුවගේ අවශ්‍යතාවයයි. මීට කදිම නිදසුනක් අංගුත්තර නිකායෙහි 'උපොසථ' සූත්‍රයෙන් හඳුනාගත හැකිය. වරෙක ආනන්ද හිමියන් බුදුරජාණන්වහන්සේගෙන් ඉල්ලා සිටිනුයේ ප්‍රාතිමොක්ෂය දේශනා කරන ලෙසය, එවිට බුදුන්වහන්සේගේ පිළිතුර වූයේ ආනන්දය පිරිස අපිරිසිදු බවයි. එය දුටු මුගලන් තෙරුන් පිරිස්වෙත ගොස් අපිරිසිදු භික්ෂුව බාහුවෙන් අල්වා එකි ස්ථානයෙන් නෙරපූ බව සඳහන්වේ.[10] විශේෂයෙන්ම උපොසථ කරණය සඳහා උපසපන් භික්ෂූන් සූදානම් වීමේ දී ආවාසයේ වැඩසිටින භික්ෂූන්ගේ සියලු සහභාගිත්වය අත්‍යවශ්‍ය වන අතර පොහොය කිරීම සඳහා වෙනත් ආවාස වලින් පැමිණි පිරිස් පිළිබඳව ඉතා විමසිල්ලෙන් ඔවුන් ඒ සඳහා සහභාගි කොට ගතයුතු බව දක්වයි. එසේ

නොවන්නේ නම් එය දුකුලා ඇවතක් වන බව දක්වා ඇත. (තෙ වෙමතිකා න විචිනන්ති අවිචිනිත්වා උපොසථං කරොන්ති ආපත්ති දුක්කටස්ස). ආවාසික භික්ෂූන් උපොසථය සඳහා පැමිණි ආගන්තුක භික්ෂූන් සඳහා ආගන්තුක සත්කාරයෙන් සංග්‍රහ කල යුතුය. ඔවුන් උපොසථය සඳහා සහභාගිකොට ගත යුතුය. ඒ ඒ භික්ෂූන්ගේ පාත්‍රා සිවුරු ආරක්ෂිතව තැබිය යුතුය, යම් ආකාරයකින් ඔවුන් දැක දැක මඟහරවා පොහොය කරන්නේනම් චුල්ලච්චය ආපත්තියක් සිදුවන බව දක්වා ඇත. මින් වඩාත් තහවුරු වනුයේ උපොසථ කරණයෙහි ඇති නෛතික භාවය හා වැදගත් කමය. උපොසථ කර්මයෙහි නෛතිකභාවය තහවුරු කිරීම සඳහා බුදුන්වහන්සේ විසින් උපොසථ කර්ම සතරක් පෙන්වා දී ඇත.

1. අධම්මෙන වග්ගං උපොසථකම්මං - අධර්මයෙන් වර්ග වූ උපොසථ කර්මය
2. අධම්මෙන සමග්ගං උපොසථකම්මං - අධර්මයෙන් සමගි වූ උපොසථ කර්මය
3. ධම්මෙන වග්ගං උපොසථකම්මං - ධර්මයෙන් වර්ග වූ උපොසථ කර්මය
4. ධම්මෙන සමග්ගං උපොසථකම්මං - ධර්මයෙන් සමගී වූ උපොසථ කර්මය

මෙහි දක්වා ඇති විවිධ උපොසථ කර්ම අතරින් ධර්මයෙන් සමගි වූ උපොසථ කර්මය පමණක් බුදුරජාණන් වහන්සේ විසින් අනුදැන ඇත. එවන් උපොසථ කර්මයක් තුළින් පමණක් සාසනයේ පැවැත්ම තහවුරු වන අතර අනෙක් සියලු උපොසථ කර්ම සාසනයාගේ විනාශයට මුල්වන බව දක්වා ඇත. එවන් ධර්මයෙන් සමගි වූ උපොසථ කරණය සඳහා විශාරද ධර්මධර භික්ෂූන්ගේ අවශ්‍යතාව බුදුන් වහන්සේ දක්වා ඇත. (බහුස්සුතො), (ආගතාගමො), (ධම්මධරො), (විනයධරො), (මාතිකාධරො), (පණ්ඩිතො), (ව්‍යත්තො), (මෙධාවි), (ලජ්ජී), (කුක්කුච්චකො), (සික්ඛාකාමො...) මෙම ආධ්‍යාත්මික



ශක්‍යතාවන් සපුරාම සසුනට ආලෝකයක් වන නිසා උපොසථ කරණය සඳහා පූර්ණ ධර්මධර විනයධර භික්ෂුවගේ අවශ්‍යතාව දක්වා ඇත. විශේෂයෙන්ම උපෝසථකරණයෙන් ආයතනගත පුද්ගල ශික්ෂණය හා ආයතනගත සාමූහික වගකීම සිදු කරනු ලබයි.

## 5. උපොසථය හා සීමාව

විනය ග්‍රන්ථයන් පරීක්ෂා කරණවිට, සීමා සම්මත කරණය සඳහා බද්ධසීමා හා අබද්ධසීමා යැයි සීමා වර්ග දෙකක් දක්වා ඇත. මෙහි බද්ධසීමා යනු එකොළොස් විපත් ඇති සීමා අතහැර ත්‍රිවිධ සම්පත්තියෙන් යුක්ත සීමාවයි. බද්ධසීමාවකදී අයෝග්‍යතාවන් එකොළසක් දක්වයි. (අති ඛුද්දිකා) ඉතා කුඩා, (අතිමහන්ත) ඉතා විශාල, (ඛණ්ඩනිමිත්ත) සීමා නිමිත්තක් නොකොට නම්කල සීමාව, (ඡායා නිමිත්ත) පර්වතයක ඡායාදි කිසියම් ඡායාවක් නිමිත්තක් කොටගත් සීමාව, (අනිමිත්ත) නිමිති නොකියා සම්මත සීමාව, (බහිසීමෙ ඨිතාසම්මතා) සීමාවෙන් පිටත සම්මත කල සීමාව, (නදියා සම්මතා) ගඟෙහි සම්මත සීමාව, (සමුද්දේ සම්මතා) මුහුදෙහි සම්මත සීමාව, (ජාතස්සරෙ සම්මතා) විලෙහි සම්මත සිමාව, (සීමාය සීමං සම්භින්දන්තෙන සම්මතා) පුරාණ සීමාවක් හා මිශ්‍රකොට සම්මත සීමාව, (සීමාය සීමං අජ්ඣොත්ථරන්තෙන සම්මතා) පුරාණ සීමාවක් යටකොට සම්මත සීමාවය, යන සීමා ප්‍රතික්ෂේප කොට, ත්‍රිවිධ සම්පත්තියෙන් යුක්ත වූ සීමා පමණක් යෝග්‍ය බව දක්වා ඇත. මෙහි ත්‍රිවිධ සම්පත්තිය යනු නිමිත්ත සම්පත්තිය, පරිස සම්පත්තිය හා කම්මාවාචා සම්පත්තියයි. විශේෂයෙන් සීමා බන්ධන විනය කර්මය පිළිබඳ ඉතා දිර්ග විස්තරයක් බුද්ධඝෝෂ හිමියන්ගේ සමන්තපාසාදිකා විනය අටුවාවෙහි හා විනය පිටකයේ මහාවග්ග පාලියේ උපෝසථක්ඛන්ධකයෙහි දක්වා ඇත. මෙහිදී නිමිත්ත යනු සම්මත කරන භූමියේ මායිම් සලකුණුය. එබැවින් සීමාවකට ගතයුතු වස්තු අටක් දක්වා ඇත. එය පබ්බත නිමිත්ත, පාසාණ නිමිත්ත, වන නිමිත්ත, රුක්ඛ නිමිත්ත, මග්ග නිමිත්ත, වම්මික නිමිත්ත, නදී නිමිත්ත, උදක

නිමිත්ත යන සලකුණු වන අතර පරිස සම්පත්තිය වශයෙන් විනයකර්මක් සිදුකිරීම සඳහා අවම වශයෙන් සතර නමකට නොඅඩු උපසපන් භික්ෂු පිරිසක් එක්රැස් වීම දක්වා ඇත. මෙලෙස සීමා සංකල්පය ක්‍රමයෙන් වර්ධනය වීමට බලපාන්නට ඇත්තේ විවිධ සංඝ කර්ම ඒ ඒ ප්‍රදේශයන් තුළ සිදුකිරීම සඳහා භික්ෂුන්ට අවසර දීම නිසාවෙන් විය හැකිය. මුල් යුගයේ බොහෝ විනය කර්ම බුදුන්වහන්සේ විසින් ම මෙහෙයවුවද පසුව එය සංඝයාට පැවරීම සිදුවූ ආකාරයක් දකිය හැකිය. ඒ අනුව විනය කර්මයක තිබිය යුතු නෛතික භාවය ආරක්ෂා කිරීමක් ලෙස ද සමස්ථ භික්ෂු ප්‍රජාව එක් රාමුවක් තුළ ක්‍රියා කල යුතුය යන්න සඳහා යෙදූ ක්‍රමවේදයන් ලෙස ද සීමා සංකල්පය හඳුනාගත හැකිය. භික්ෂු සාසනය හා සීමාව අතර ඇති සමීප සම්බන්ධතාවය හේතු කොටගෙන සීමා විපත්තිය ආරක්ෂාකර ගැනීමට ථෙරවාදී භික්ෂුන් විසින් දැඩි උත්සාහයක් දරණ ලද බව සීමා ඉතිහාසයේ ප්‍රකටවේ. ක්‍රි.ව ආරම්භයේ පමණ සිට සීමාව පහළ වූයේ ද මේ හේතුව නිසායැයි කඹුරුපිටියේ අරියසේන හිමියෝ... ප්‍රකාශ කරති.[11] කෙසේ වුවද සංචාරක ජීවිතයෙන් ආවාසික ජීවිතයකට නැඹුරුවූ භික්ෂුන් ස්වාධිකාරි තත්වයන්ගෙන් වෙන්ව සංස්ථාගත චාරිත්‍ර වලට අවනතව හා අනුගතව සංඝ සංස්ථාව ශක්තිමත් කිරීම සඳහා සීමා සංකල්පයෙන් ලැබී ඇති ආලෝකය සුවිශේෂිය.

## 6. ගෘහස්ථ උපොසථය

අංගුත්තර නිකාය තික නිපාතයේ මහවග්ගයේ විසාකුපොසථ සූත්‍රයට අනුව බුදුරජාණන් වහන්සේ තෙවදෑරුම් උපොසථයක් පිළිබඳව කරුණු දක්වති. ඒ අනුව

ගෝපාලක උපෝසථය

නිගන්ඨ උපෝසථය

අරියූපෝසථය



මෙහි ගෝපාලක උපෝසථය යනු මෙරමාගේ ගවයන් රකින්නා වූ ගොපලුවෙකුට පස්ගෝරස අහිමි වන්නාසේ සීල සමාදානය පිළිබඳව අපේක්ෂා රහිතව බාහිර දේ ගැන අවිද්‍යා සිතින් වෙසේ නම් ඔහු පෙහෙවසින් නියම අනුසස් නොලබන බවයි. නිගන්ඨ උපෝසථය ලෙස දක්වා ඇත්තේ එවකට නිගන්ට ශාසනය තුළ දක්නට ලැබුණ ව්‍රත සමාදාන හෙවත් පෙහෙවස් සමාදානයයි. නිගන්ඨ ශාසනයෙහි භාවිත ව්‍රත සමාදානය ප්‍රායෝගිකව හරසුන් බව දක්වූ උන්වහන්සේ අරියූපෝසථය ලෙස, බුදුසමයෙන් පිළිගත් උපෝසථ ආචාර ධර්ම පද්ධතියක් දේශනාකොට ඇත. විශේෂයෙන් කෙලෙසුන්ගෙන් කිලිටි සිත උපක්‍රමයෙන් පිරිසිදු කිරීමක්වේ ද එය මේ සාසනයෙහි අරියූපෝසථය නම් වේ. එහි දී එම අරියූපෝසථය ප්‍රභේද රාශියකින් පෙළගස්වා ඇත, එනම් බ්‍රහ්ම උපෝසථය, ධම්ම උපෝසථය, සංඝ උපෝසථය, සීල උපෝසථය, දේවතා උපෝසථය ලෙස. මෙම සියලු උපොසථ ප්‍රභේද තුළින් දක්වා ඇත්තේ බුදුන්, දහම්, සඟුන් කෙරෙහි දක්නට ගුණ සිහිකොට ක්‍රමයෙන් සීලමය හා කුසලමය පක්ෂය පුද්ගලයා තුළ වර්ධනය කිරීමට පුද්ගලයා මෙහෙයවීමය.

මේ ආකාරයෙන් බලන විට බෞද්ධ උපෝසථ දිනය හා උපොසථ වත අනෙකුත් ආගමික සම්ප්‍රදායන්ට වඩා අර්ථ සම්පන්නය. එහි අරමුණ හා ඉලක්ක නිවන් මූලික කොට ඇත. අනික් අතට සංඝ සමාජය නම් වූ ආයතනය කිසියම් ව්‍යුහගත රාමුවකට නතු කරමින් පොදුබව ආරක්ෂා කරමින් සමගිව නැගීසිටීමේ බලය තහවුරු කිරීමට ගත් උත්සහයක ලක්ෂණ ද ප්‍රකට කරලයි.

## 7. නිගමනය

උපොසථයෙහි ආරම්භය අන්‍යාගමික සම්ප්‍රදායයන් දක්වා දිව ගියද බෞද්ධ උපොසථය අනෙකුත් ආගමික ඉගැන්වීම් තුළින් වියුක්තය. එහි සැබෑ පරමාර්ථය සංඝ සාමග්‍රිය ඉස්මතුකොට විනය තුළින් පුද්ගල ශික්ෂණය ගොඩනගා විමුක්තිය සාධනය

කිරීමය. බුදුසමයට අනුව උපොසථය ගිහි පැවිදි ලෙස ආකාර දෙකකින් සංග්‍රහ කොට ඇතත් භික්ෂු සංස්ථාව අරමුණු කොට ඇති උපොසථය කිසියම් සම්මත සීමාවක් තුළ සිදුකල ද ගෘහස්ථ උපොසථය තුළ එබඳු ලක්ෂණයක් දැකිය නොහැකිය. භික්ෂු උපොසථය සඳහා රහතන් වහන්සේගේ දායකත්වයද අත්‍යවශ්‍යවීම තුළින් පෙනීයන්නේ උපොසථය බෞද්ධ සම්ප්‍රදය තුළ ප්‍රබල ආගමික, සාමාජික හා ආධ්‍යාත්මික දායකත්වයන් සලසන බවයි.

## ආන්තික සටහන්


1. Monier William, *Sanskrit English Dictionary,* පි. 206
2. ලියනේගම, චන්දසිරි, *අභිස්තව, උඩුගම්පල ගුණානන්ද ශාස්ත්‍රිය සංග්‍රහය,* උපොසථය සෙවීම, පි. 54
3. *ගුණසේන සිංහල මහාඅකාරාදිය,* පි. 215
4. ශාසන රතන හිමි මොරටුවේ, *විනය කෝෂය* 11, පි. 321
5. Childers, *Dictionary of Pali Language,* පි. 535
6. සුමංගල හිමි මඩිතියවෙල, *පාලි සිංහල ශබ්දකෝෂය,* පි. 182
7. *ශික්ෂණය හා විමුක්තිය,* ජෝන් ක්ලිෆර්ඩ් (පරිවර්තනය) උදය ප්‍රසාන්ත මැද්දේගම පි. 113
8. රාහුල හිමි කොටපිටියේ, *බෞද්ධ විනය අධ්‍යයනය,* පි. 277
9. එම පි. 278
10. අංගුත්තර නිකාය 05, *උපොසථ සුත්‍රය* පි. 92
11. *අභිවන්දනා, මීරියබැද්දේ උපනන්ද උපහාර ශාස්ත්‍රීය සංග්‍රහය,* පි. 67